ලිපිය සම්පූර්ණයෙන් කියවන්න.

# අබේපුස්ස නාවිමන ආරණ්‍ය සේනාසනය - 2020
## දානය පිලිබඳ දැනුම් දීමයි

දුරකථන සබඳතා
උදේ 7.30 - 8.30
දහවල් 1.00 - 2.00

දානය දෙන දිනය : ..................................................

දායකත්වය : .............................................................................................මහතා / මහත්මිය

**දැනට සෙනසුනෙහි නේවාසික පිරිස මෙසේය.**

| | |
|---|---|
| වැඩසිටින ස්වාමින් වහන්සේලා ගණන | |
| සිල් සමාදන්ව සිටින උපාසක පිරිස | - |
| කාර්ය මණ්ඩලය | |
| වෙනත් | - |

- **මෙම ගණන් වෙනස්විය හැකි නිසා දානයට පළමු දින දුරකථනයෙන් විමසා බලන්න.**

රාග ද්වේශ මෝහයෙන් තොරව ශීලයේ පිහිටා තමා විසින් පිළියෙල කොට ඉතාමත් ශ්‍රද්ධාවෙන් දානය පිළිගැන්වීමට පැමිණෙන පිංවත් දායක ඔබසැම නාවිමන සෙනසුන වෙනුවෙන් ඉතා ගෞරවයෙන් පිළිගනිමු.

01. මෙම පුණ්‍යභූමියෙහි ගත කරන කාලය තුල මනා හික්මීමකින් හා සංවරශිලීව හැසිරීමට සියලුදෙනා වගබලා ගතයුතු අතර එය ප්‍රධාන දායකතුමාගේ / තුමියගේ වගකීමක්ද වේ. කුඩා ළමුන් සමඟ පැමිණෙන්නේ නම් ඔවුන් ස්ථානයට ගැලපෙන සේ. හැසිරවීමට වගබලාගත යුතුය.

02. මත්දියර සහ දුම්වැටි වලින් සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. එය උල්ලංඝනය කිරීම පිංවත් ඔබගේත් අප ස්ථානයේත් ගෞරවයට හානියක් වන බැවින් **<u>දාන දායකත්වය අහෝසි කිරීමට සිදුවන බව තදින් සිතට ගන්න.</u>**

03. මෙම වසරේ සිට පොහොය දින දායකයන්ද සාමාජිකයන් සේ සැලකීමට සේනාසනය තීරණය කර ඇත. ඒ සඳහා පහත අයුරින් උපකාර කල හැක.

04. දානයට අමතරව ඔබ විසින් පිරිකර වශයෙන් යමක් පූජා කිරීමට අපේක්ෂා කරන්නේනම් දානය දීමට කලින් කාර්යාලයෙන් විමසා සුදුසුදෙය පිළියෙළ කර ගැනීම. වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත. ඒ සඳහා මෙම දුරකථන අංකය භාවිත කරන්න. **035-3350651**

05. මෙම ලිපිය ලැබී සතියක් ඇතුලත දානය සඳහා පැමිණෙන/ නොපැමිණෙන බව දුරකථනය මගින් දැනුන් දීමට කාරුණික වන්න. එසේ නොදන්වන්නේනම් දාන වාරය වෙනත් අයකුට යොමු කරනු ඇත.

06. දායක පිරිසට නේවාසික පහසුකම් ඇති නමුත්, රාත්‍රී නිදාගැනීම සඳහා **තමන්ට අවශ්‍ය කොට්ට සහ පැදුරු ඔබලා විසින් රැගෙන පැමිණෙන්න.**

07. දානය පිළියෙල කිරීමට නොපැමිණෙන මුදල් භාරදී දානය පිළිගැන්වීමට පමණක් හෝ නොපැමිණෙන දායකයින් එසේ එක දිගට වාර තුනක් සිදුකලහොත් දානය අවලංගු කිරීමට සිදුවන බව අමතක නොකරන්න.

08. මෙම සේනාසනය පවත්වාගෙන යනු ලබන්නේ දායක පින්වතුන් 366 ගේ අනුග්‍රහයෙනි. එබැවින් කුටි සෙනසුන් මාර්ග පද්ධතිය ජලනල පද්ධතිය ආදී අත්‍යාවශ්‍ය දේ නඩත්තු වන්නේද පින්වත් ඔබගේ සහයෙන් බැවින්, ඒ සඳහා උපකාර කිරීමටද අමතක නොකරන්න. ඔබ යම් මුදලක් පරිත්‍යාග කරන්නේනම් ලදු පතක් ලබාගැනීම මැනවි. ලදු පතක් නොගෙන මුදල් ගෙවීමක් කිසිවිටකවත් නොකරන්න.

- **තවද පහත කරුණු සඳහා විශේෂ අයකිරීමක්ද සිදුකෙරෙන බව කරුණාවෙන් සලකන්න.**

| | |
|---|---|
| සාමාජික මුදල | රු. 2,000 |
| විදුලිය | රු. 300 |
| සෙනසුනෙන් ගෑස් (එක සිලින්ඩරයක් භාවිතා කරයි නම්) | රු. 500 |
| | |
| එකතුව | රු. 2,800 |

07. පිංවත් ඔබගේ කාල සටහන මෙසේය.

| | |
|---|---|
| බුද්ධ වන්දනාව | සවස 06:30 |
| ආරාධනාව සහ ධර්ම ශ්‍රවණය | සවස 07:30 සිට 08:00 දක්වා |
| උදේ දානය පූජා කිරීම (බුද්ධ පූජාව) | උදේ 05:30 |
| උදේ දානය පූජා කිරීම (මහා සංඝරත්නයට) | උදේ 06:00 |
| විහාරමළුව බෝමළු පිරිසුදු කිරීම සහ වත් පිළිවෙත් | |
| දවල් දානය පූජා කිරීම (බුද්ධ පූජාව) | දවල් 10:00 |
| දවල් දානය පූජා කිරීම (මහා සංඝරත්නයට) | දවල් 11:00 |
| සෙනසුන නැරඹීම | දවල් 11:00 සිට 12:00 |
| සෙනසුන් භාණ්ඩ පිරිසිදු කිරීම | දවල් 12:00 සිට |

08. මේ උතුම් පුණ්‍යකර්මය සඳහා ඔබ විසින් රැගෙන ආ යුතු දේ.

| | |
|---|---|
| **සවස බුද්ධ පූජාව (බෝධි පූජාව)** | පොල්තෙල් ½ / මල් / හඳුන්කූරු / එයාෆ්‍රෙෂ්නර් |
| **අෂ්ඨපාන සෑදීමට** | අඹ මිදි / ඇපල් / දොඩම් (සාමාන්‍ය) /පේර / පැණි දොඩම් (නාරං) උගුරැස්ස/ නෙල්ලි/ වෙරළු / බෙලි/ දිවුල්/ අඹ/ පැෂන්/ දෙළුම් **මේවායින් වර්ග 8ක් පොඩි පොඩි ප්‍රමාණයන්ගෙන් (කප් සඳහා සෑදීමට.)** |
| **ආරාධනා වට්ටිය** | බුලත් / පුවක් / හුණු / එන්සහල් / කරාබුනැටි / පොල්තෙල් ½<br>හඳුන්කූරු පැකට්, සීනි,<br>තේ කොළ, රවුම් ඉටිපන්දම් 3ක්,<br>ගිනිපෙට්ටි |
| **ගිලන්පසට (ස්වාමීන්වහන්සේලාට)** | කිලෝ පේර ගෙඩි - 5<br>දෙළුම් ගෙඩි - 3<br>බෙලි ගෙඩි - 4<br>පැණි දොඩම් ගෙඩි - 5<br>බීම වර්ගයක්<br>**කුමක් හෝ මෙයින් එක් වර්ගයක් රැගෙන ආ යුතුය.** |

09. අපගේ අපේක්ෂාව සියතින් දානය සකස් කර පූජා කිරීමට ඔබව පෙළඹවීමයි. නොවැලක්විය හේතුවක් නිසා ඔබ දානය දීමට නොපැමිණෙන්නේනම්.

| | |
|---|---|
| හීල / දවාල දාන කළමනා සඳහා | 3000 + 5000 = 8000.00 |
| හීල/ දවාල දානය පිසීම සඳහා | 2000.00 |
| සාමාජික මුදල | 2000.00 |
| එකතුව | 12,000.00 |

පමණ මුදලක් ගෙවිය යුතුය. එම මුදල ගරු, **J.සුනිල්ශාන්ත මයා, නාවිමන ආරණ්‍ය සේනාසනය, බලතව, අඹේපුස්ස.** යන ලිපිනයට මුදල් ඇණවුමක් මගින් එවිය යුතුය. (**වරකාපොල තැපැල් කාර්යාලයට යොමු කරීමට කාරුණික වන්න.**)

නැතහොත්-

- **සම්පත් බැංකුවේ නාවිමන ආරණ්‍ය සේනාසනය නමින් ඇති ගිණුමේ**
- **ගිණුම් අංක 120561003394 යන වරකාපොල ශාකාවට යොමුකළ හැක.**

වැඩ සිටින ස්වාමීන්වහන්සේලා ගණන වැඩිවීමත් සමග පිංවත් ඔබගේ ආධාර මුදල ඉහල නැංවීමට සිදුවන බව කරුණාවෙන් සලකන්න. එය ඔබට අපහසුතාවයක්නම් බොහෝපිරිසක් දාන වාරයක් බලාපොරොත්තුවෙන් සිටින බැවින් ඔබේ එම දාන වාරය වෙනත් අයකුට ලබාදිය හැකිය.

තුන් සිත පහදවාගෙන බුදු සසුනේ දියුණුව උදෙසාම ඔබතුමා/ඔබතුමිය සිදුකරනු ලබන දානමය පුණ්‍යකර්මය සැම දෙනාටම ආයු, වර්ණ, සැප, බල, ප්‍රඥා වැඩීම පිණිසම වේවා...! නිවන් අවබෝධය පිණිසම වේවා....! සැමට තෙරුවන් සරණයි...!

නාවිමන වන සෙනසුන,
බලතව - අඹේපුස්ස
දුරකථනය : 035-3350651, 071-4237054
ඊ මේල් - navimanasl@gmail.com

මෙයට
ගරු ලේකම්,
කාර්ය සාධක සමිතිය,
නාවිමන අරණ්‍ය සේනාසනය